## 2. 1. 4. 8.

[සාවත්ථිනිදානං:]

39. යස්මිං භික්ඛවෙ සමයෙ චොරා බලවන්තො හොන්ති, රාජානො තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ රඤ්ඤො න ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා පච්චන්තිමෙ වා ජනපදෙ අනුසඤ්ඤාතුං. බ්‍රාහ්මණගහපතිකානම්පි තස්මිං සමයෙ න ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා බාහිරානි වා කම්මන්තානි පටිවෙක්ඛිතුං. එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ පාපභික්ඛූ බලවන්තො හොන්ති, පෙසලා භික්ඛූ තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ පෙසලා භික්ඛූ තුණ්හීභූතා තුණ්හීභූතා සඞ්ඝමජ්ඣෙ සංකසායන්ති[1] පච්චන්තිමෙ වා ජනපදෙ භජන්ති. තයිදං භික්ඛවෙ හොති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං.

යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො බලවන්තො හොන්ති, චොරා තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ රඤ්ඤො ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා, පච්චන්තිමෙ වා ජනපදෙ අනුසඤ්ඤාතුං. බ්‍රාහ්මණගහපතිකානම්පි තස්මිං සමයෙ ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා, බාහිරානි වා කම්මන්තානි පටිවෙක්ඛිතුං. එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ පෙසලා භික්ඛූ බලවන්තො හොන්ති, පාපභික්ඛූ තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ පාපභික්ඛූ තුණ්හීභූතා තුණ්හීභූතා සඞ්ඝමජ්ඣෙ සංකසායන්ති, යෙන වා පන තෙන පපතන්ති.[2] තයිදං භික්ඛවෙ හොති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

## 2. 1. 4. 9.

40. ද්වින්නාහං භික්ඛවෙ මිච්ඡාපටිපත්තිං න වණ්ණෙමි, ගිහිස්ස වා පබ්බජිතස්ස වා. ගිහී වා භික්ඛවෙ පබ්බජිතො වා මිච්ඡාපටිපන්නො මිච්ඡාපටිපත්තාධිකරණහෙතු නාරාධකො හොති ඤායං ධම්මං කුසලං.

ද්වින්නාහං භික්ඛවෙ සම්මාපටිපත්තිං වණ්ණෙමි, ගිහිස්ස වා පබ්බජිතස්ස වා. ගිහී වා භික්ඛවෙ පබ්බජිතො වා සම්මාපටිපන්නො සම්මාපටිපත්තාධිකරණහෙතු ආරාධකො හොති ඤායං ධම්මං කුසලන්ති.

## 2. 1. 4. 10.

41. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ දුග්ගහිතෙහි සුත්තන්තෙහි බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථඤ්ච ධම්මඤ්ච පටිබාහන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය පටිපන්නා බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති. තෙ චිමං සද්ධම්මං අන්තරධාපෙන්ති.

http://www.dhammikaweb.com/

1. සඞ්ඛායභාති, අට්ඨකථා – සංඛායභාති - සාළුවි. 2. පසාකම්භාති - මජසං.



## 2. 1. 4. 8.

**[සැමැත්නිදානයි:]**

39 මහණෙනි, යම් කලෙක්හි සොරු බලවත් වෙත් ද, රජවරු එසමයෙහි දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි රජුට (ඇතුළුනුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළුනුවරින්) නික්මෙන්නට හෝ පසල්දනව්වෙහි (කටයුතු) සංවිධාන කරන්නට හෝ පහසු නො වෙයි. එසමයෙහි බමුණු ගෘහපතියන්ට ද (ඇතුළුනුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළුනුවරින්) නික්මෙන්නට හෝ බැහැර කටයුතු සංවිධාන කරන්නට හෝ පහසු නො වේ. මහණෙනි, එසේ ම යම් සමයෙක්හි පවිටු භික්ෂූහු බලවත් වෙත් ද, එසමයෙහි පේශල භික්ෂූහු දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි පේශල භික්ෂූහු පුත පුතා නිශ්ශබ්ද වූවාහු සඟ මැද කර බහා හිඳුනාහ. පසල් දනවු හෝ ඇසුරු කරන්නාහ. මහණෙනි, මේ කරුණ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙව්මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේ.

මහණෙනි, යම් කලෙක්හි රජවරු බලවත් වෙත් ද, එසමයෙහි සොරු දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි රජුට (ඇතුළු නුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළු නුවරින්) නික්ම යන්නට හෝ පසල් දනවුවෙහි (කටයුතු) සංවිධාන කරන්නට හෝ පහසු වෙයි. එසමයෙහි බමුණු ගෘහපතියනට ද (ඇතුළු නුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළු නුවරින්) නික්ම යන්නට හෝ බැහැර කටයුතු සංවිධාන කරන්නට හෝ පහසු වේ. මහණෙනි, එසේ ම යම් සමයෙක්හි පෙශල භික්ෂූහු බලවත් වෙත් ද, එසමයෙහි පවිටු භික්ෂූහු දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි පවිටු භික්ෂූහු පුත පුතා නිශ්ශබ්ද වූවාහු සඟ මැද කරබහා හිඳුනාහ. යම් මැ තැනෙක හෝ යෙත්. මහණෙනි, ඒ මේ කරුණ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙව්මිනිසුනට හිත පිණිස සුව පිණිස වේ.

## 2. 1. 4. 9.

40. මහණෙනි, මම ගිහියාගේ වේව යි පැවිද්දාගේ වේව යි දෙදෙනාගේ වරදවා පිළිපැදුම වර්ණනා නො කරමි. මහණෙනි, වරදවා පිළිපන් ගිහියා වේව යි පැවිද්ද වේව යි වරදවා පිළිපැදුම් හෙතුයෙන් විදර්ශනා සහිත මාර්ගය පුරන්නට නො හැකි වෙයි.

මහණෙනි, මම ගිහියාගේ වේව යි පැවිද්දාගේ වේව යි දෙදෙනාගේ නිවැරදි පිළිපැදුම වර්ණනා කරමි. මහණෙනි, නිවැරදි ව පිළිපන් ගිහියා වේව යි පැවිද්ද වේව යි නිවැරදි පිළිපැදුම් හේතුයෙන් විදර්ශනා සහිත මාර්ගය පුරන්නට හැකි වෙයි.

http://www.dhammikaweb.com/

2. 1 4. 10.

41. මහණෙනි, යම් මහණ කෙනෙක් වරදවා ගන්නා ලද පදප්‍රතිරූපක වූ (ශබ්දවින්‍යාසයෙන් වරදවා ගත්තට නිසි) සූත්‍රාන්තයෙන් අටුවා ද පෙළ ද පිළිබහත්තාහු ද, මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට අහිත පිණිස ද බොහෝ දෙනාට නොසුව පිණිස ද බොහෝ දෙනාට අනර්ථ පිණිස ද දෙවි-මිනිසුනට අහිත පිණිස ද දුක් පිණිස ද පිළිපන්නාහු ය. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ අකුසල් ද රැස් කෙරෙත්. ඔහු ම මේ සස්න ද අතුරුදන් කෙරෙත්.

Free Distribution www.aathaapi.org



යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සුග්ගහිතෙහි සුත්තන්තෙහි න බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථඤ්ච ධම්මඤ්ච අනුලොමෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති. තෙ ඉමං සද්ධම්මං ඨපෙන්තීති.

**සමචිත්තවග්ගො චතුත්ථො**

---



මහණෙනි, යම් මහණ කෙනෙක් මැනැවින් ගන්නා ලද ව්‍යඤ්ජන ප්‍රතිරූපක නොවූ (අක්ෂරවින්‍යාසයෙන් වැරදි ලෙස අදහස ගත්තට නොනිසි) සූත්‍රාන්තයෙන් අර්ථය ද ධර්මය ද අනුව පවත්නාහු ද, මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙවිමිනිසුනට හිත පිණිස සුව පිණිස පිළිපන්නාහු ය. මහණෙනි, ඒ මහණහු බොහෝ කුසල් ද රැස් කෙරෙත්. ඔහු ම මේ ශාසනය තබත් සී.

**සිවුවැනි සමසිත්වගයි.**

---

http://www.dhammikaweb.com/